# VII වන පරිච්ඡේදය

## දීමනා සහ ගාස්තු

1. කොමිෂන් සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ සාමාජිකයින් සඳහා දීමනා
2. විශ්වවිද්‍යාලයන්හි පාලක සභාවට පත්කළ සාමාජිකයින්ට සහ විශ්වවිද්‍යාල විද්‍යායතනයක / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක පාලක බල මණ්ඩල සාමාජිකයන් සඳහා වන දීමනා
3. ස්ථාවර කමිටු / ශාස්ත්‍රීය කමිටු / අධ්‍යයන මණ්ඩල/ යථායෝගී කමිටු සාමාජිකයින් සඳහා ගෙවනු ලබන දීමනා / ගෙවීම්
4. මණ්ඩප සභාවක / පීඨ සභාවක ඡන්දයෙන් තෝරාගනු ලැබූ/ පත්කල සාමාජිකයින් සඳහා දීමනා
5. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයාට සහ සාමාජිකයන් හට ගෙවනු ලබන දීමනා
6. උසස් අධ්‍යාපන ආයතනයන් හි සේවකයින් සඳහා දීමනා ලබාදීම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය මත සිදුවිය යුතු ය
7. කොමිෂන් සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා/ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා / මන්ඩපයක මන්ඩපධිපතිවරයා හට නිවාස පහසුකම් / දීමනාවක් ලබා දීම
8. සංග්‍රහ දීමනා ප්‍රතිපූර්ණය කිරීම
9. පීඨයක පීඨාධිපතිවරයකු / අධ්‍යයනාංශ ප්‍රධානියකු සහ දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් ඇති වෙනත් තනතුරක් දරන තැනැත්තකු සඳහා දීමනා
10. නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම
11. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ඇති ආචාර්යවරුන් / නිලධාරීන් වෙත ගෙවිය හැකි දීමනා
12. පර්යේෂණ දීමනාව ගෙවීම
13. අධ්‍යයන දීමනාව / වෙනත් විශේෂ දීමනා
14. විදේශ ගමන් සහ අදාල වියදම් සඳහා වන දීමනා
15. වෛද්‍ය සුදුසුකම් සහිත ආචාර්යවරුන් / නිලධාරීන් සහ දන්ත වෛද්‍ය සුදුසුකම් සහිත ආචාර්යවරුන් සඳහා ගෙවන දීමෑ
16. ශිෂ්‍ය උපදේශකවරුන්ට ගෙවන දීමනා
17. කොමිෂන් සභාවේ උප සභාපතිවරයාගේ, ලේකම්වරයාගේ / විශ්වවිද්‍යාලයක නියෝජ්‍ය උපකුලපතිවරයාගේ, ලේඛකාධිකාරීවරයාගේ / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාගේ, ලේකම්වරයාගේ / විද්‍යායතනයක අධ්‍යක්ෂකවරයාට / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික සහකාරවරයකු / වරියකු හට ගෙවන දීමනා

18. උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය සඳහා ද්විතීයනය කරන ලද වෛද්‍ය නිලධාරීන් හට ගෙවනු ලබන අමතර රාජකාරී දීමනාව

19. නිවාඩු දිනයන්හි සේවය කරනු ලබන විධායක නිලධාරීන් සඳහා වන දීමනා

20. දිර්ඝ කාලීන සේවා දීමනාව

21. අර්ධ කාලීන කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරුවකු හට ගෙවන දීමනාව

22. පෝමලින් රසායනිකයට නිරාවරණය වීමේ අවදානම ඇති, වෛද්‍ය පීඨයක සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අනතුරු දීමනාවක් ගෙවීම

23. පශ්චාත් මරණ පරික්ෂණ සහයකයින්ට සහ පශ්චාත් මරණ පරික්ෂණ කම්කරුවන් හට දීමනා

24. ජීවන වියදම් දීමනාව

25. ගෙවිය නොහැකි දීමනා

26. ලේඛනාගාරයන් භාරව සිටින පොත් බඳින්නන් සඳහා ගෙවිය හැකි දීමනා

27. ලඝු ලේඛකයින් සඳහා ගෙවන දීමනා

28. පූර්ණකාලීන උපශාලධිපතිවරුන්ට දීමනා ගෙවීම

29. තේරීම් කමිටු සාමාජිකයන් සඳහා ගෙවනු ලබන දීමනා

30. පරිපාලන නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ලබාගත් අධ්‍යාපනික / වෘත්තීමය සුදුසුකම් අගය කිරීම උදෙසා ගෙවනු ලබන වැටුප් වර්ධක දීමනා

31. ගමන් වියදම් දීමනා සහ සංයුක්ත දීමනා

32. කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතන / විද්‍යායතන විසින් පවත්වනු ලබන විභාගයන්ට අදාල, ප්‍රශ්න පත්‍ර පිළියෙල කීරීම සහ ඇගයීම, සුපරීක්ෂණය සහ අධීක්ෂණය සඳහා ගෙවිය හැකි ගාස්තු

33. බාහිර කථිකාචාර්යවරුන්ගේ ප්‍රවාහන සහ අනෙකුත් දීමනා

34. ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීම් සහ විභාග වැරදි වලට අදාල සිද්ධීන් සඳහා පරීක්ෂණ පැවැත්වීමට පත්කරන පරී ) සාමාජිකයන් සඳහා ගෙවීම් කිරීම

35. ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීම් හා සම්බන්ධ සිද්ධීන් පරීක්ෂා කිරීම පිණිස පවත්වනු ලබන පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම

36. හිමිකම් ලත් නිලධාරීන් සඳහා ලබාදෙන ඉන්ධන / ප්‍රවාහන දීමනාව

## VII වන පරිච්ඡේදය

### දීමනා සහ ගාස්තු

1. **කොමිෂන් සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ සාමාජිකයින් සඳහා දීමනා**

1.1 පනතෙහි 5 (4) වගන්තියේ නියමකොට ඇති ආකාරයෙන්, කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට, උසස් අධ්‍යාපනය භාර ආමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර ආමාත්‍යවරයා විමසීමෙන් අනතුරුව තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් සහ දීමනා ගෙවිය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා / උප සභාපතිවරයා / සාමාජිකයින්

2. **විශ්වවිද්‍යාලයන්හි පාලක සභාවට පත්කළ සාමාජිකයින්ට සහ විශ්වවිද්‍යාල විද්‍යායතනයක / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක පාලක බල මණ්ඩල සාමාජිකයන් සඳහා වන දීමනා**

2.1 විශ්වවිද්‍යාලයක පාලක සභා සාමාජිකයන්, විශ්වවිද්‍යාල විද්‍යායතනයක / ආයතනයක / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක පාලක බල මණ්ඩල සාමාජිකයින් කිසිදු පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ලැබීම සඳහා හිමිකම් නො ලැබුව ද, පනතෙහි 44 (1) (VII) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල පාලක සභාවට පත්කල සාමාජිකයකු හෝ පනතෙහි 63 (1) (IV) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල විද්‍යායතනයක කළමනාකරණ මණ්ඩලයට පත්කල සාමාජිකයකු හෝ පනතෙහි 24 (3) වගන්තියට අනුව සහ ඒ ඒ ආයතනයට අදාල නියමාවලියක සඳහන් වූ විද්‍යායතනයක / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක එම ආයතනයෙහිම සේවය නොකරන පාලක බල මණ්ඩල සාමාජිකයකු හට, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් අනතුරුව, උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දීමනා ගෙවිය හැකි ය. [පනතෙහි 44 (6) සහ 63 (2) වගන්ති වල සහ එම ආයතනය පිහිටුවීමට අදාල නියමාවලියන් වල සඳහන් නියමයන්ට අනුකූලව )

පාලක බල මණ්ඩලවල සාමාජිකයන්

2.2 එවැනි පත්කළ සාමාජිකයින් සඳහා, රජයේ අනුමත රෙගුලාසි වලට අනුව ප්‍රවාහන සහ යැපීම් දීමනා ද ගෙවිය යුතු ය.

සහභාගි වීමේ දීමනාවට අමතරව ප්‍රවාහන යන යැපීම් දීමනා

3. **ස්ථාවර කමිටු / ශාස්ත්‍රීය කමිටු / අධ්‍යයන මණ්ඩල/ යථායෝගී කමිටු සාමාජිකයින් සඳහා ගෙවනු ලබන දීමනා / ගෙවීම්**

කමිටු වල සාමාජිකයන්

තම ආයතනයෙන් හැර, යම් උසස් අධ්‍යාපන ආයතනයක ස්ථාවර කමිටුවක / අධ්‍යයන මණ්ඩලයක / ශාස්ත්‍රීය කමිටුවක / යථායෝගී කමිටුවක හෝ දෙපාර්තමේන්තු කමිටුවක සෑම සාමාජිකයෙකු සඳහා ම, කොමිෂන් සභාව විසින් වරින් වර තීරණය කරනු ලබන ආකාරයට ඔවුන්ගේ ප්‍රවාහන සහ යැපීම් දීමනාවන් ට අමතරව, එක් එක් රැස්වීම් සඳහා දීමනාවක්/ ගෙවීමක් සිදු කළ හැකිය. යම් සාමාජිකයකු එම රැස්වීම සඳහා දුරස්ථ සන්නිවේදන මාර්ගයක් ඔස්සේ සහභාගි වන්නේ නම්, ඔහු ද අනෙකුත් සාමාජිකයන් ලෙසටම ඉහත දීමනා / ගෙවීම් ලබා ගැනීමට හිමිකම් ලබයි. මෙම නියමයන් කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු සහ යථායෝගී කමිටු සාමාජිකයන් සඳහා ද බල පැවැත්වෙනු ඇත.

**4. මණ්ඩප සභාවක / පීඨ සභාවක ඡන්දයෙන් තෝරාගනු ලැබූ/ පත්කල සාමාජිකයින් සඳහා දීමනා**

මණ්ඩප සභාවක / විශ්ව විද්‍යාලයක/ පීඨ සභාවක ඡන්දයෙන් තෝරාගත් සාමාජිකයකු හෝ පත්කල සාමාජිකයකු හට, ඔහුගේ ප්‍රවාහන සහ යැපීම් දීමනා වලට අමතර ව, කොමිෂන් සභාවෙන් වරින් වර තීරණය කරනු ලබන ආකාරයට සහභාගි වීමේ දීමනාවක් ගෙවිය යුතු ය. දුරස්ථ සන්නිවේදන මාර්ගයක් තුලින් එම රැස්වීම් වලට සහභාගි වන සාමාජිකයන් සඳහා ද ඉහත සඳහන් ගෙවීම් කළ යුතු වේ. පනතෙහි 48 (1 A) (f) සහ 48 A (2) යන වගන්ති වල සඳහන් නියමයන් සහ එවැනි සභාවක් පිහිටුවීමට අදාල ව නිකුත් කරන ලද නියමාවලියක අඩංගු නියමයන් බලන්න. මණ්ඩප සභාව / පීඨ සභාව

**5. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයාට සහ සාමාජිකයන් හට ගෙවනු ලබන දීමනා**

5.1 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයාට සහ සාමාජිකයන් හට ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් සහ දීමනා, මුදල් විෂය භාර ආමාත්‍යවරයා විමසීමෙන් අනතුරුව, උසස් අධ්‍යාපන ආමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. [පනතෙහි 82 (4) වගන්තියට අනුව ] විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන්

**6. උසස් අධ්‍යාපන ආයතනයන් හි සේවකයින් සඳහා දීමනා ලබාදීම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය මත සිදුවිය යුතු ය**

6.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක කිසිඳු සේවකයකු සඳහා, කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගත් කුමන ආකාරයේ හෝ ගෙවීමක් සිදු නො කළ යුතු ය. කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය

6.2 නිශ්චිත ව්‍යාපෘතියක් සඳහා හෝ නිශ්චිත වෙනත් කාර්යයක් සඳහා උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට බාහිර ප්‍රභවයකින් ප්‍රදානයන් ලැබී ඇති කල්හි, එබඳු ව්‍යාපෘතියක හෝ වෙනත් කාර්යයක නිරත වී සිටින උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක කාර්ය මණ්ඩල සාමාජිකයකු සඳහා දීමනා ගෙවීම සඳහා එම ප්‍රදානයෙහි විධිවිධාන සළසා ඇත්නම්, අදාල උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනය සහ ප්‍රදායකයා අතර ඇති කරගත් ගිවිසුමේ සඳහන් ප්‍රමාණයන් තුල හිඳිමින් දීමනාවක් ගෙවීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවේ. බැහැර වීම්

**7. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයාට / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාට / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාට / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයාට නිල නිවාස පහසුකම් / දීමනා**

7.1 කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට, විශ්වවිද්‍යාලයන්හි උපකුලපතිවරුන් ට, විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි අධ්‍යක්ෂකවරුන්ට, මණ්ඩපයක මණ්ඩපාධිපතිවරුන්ට, ඔවුන්ගේ ධුර කාලය තුල දී පහත සඳහන් ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් නිල නිවාස පහසුකම් සැපයිය යුතු ය. නිල නිවාස පහසුකම් / දීමනා

(අ)කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට අයත් නිවාස ක්‍රමවේදයන්

(ආ )ඒ ඒ ආයතනය මඟින් කුලියට ගත් නිවාස

(ඇ) නිලධාරියාගේ නිවස හෝ ඔහු විසින් කුලියට ගත් නිවාසයන්

නිල නිවාස පහසුකම් ඉල්ලා සිටින නිලධරයින්, තමන් ඉහත සඳහන් කුමන ක්‍රමවේදයන් තුල සිටිමින් නිල නිවාස පහසුකම් ඉල්ලා සිටින්නේ ද යන්න සඳහන් කරමින්, එසේ අයදුම් කිරීම ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

7.2 කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සතුව නිල නිවාස නොමැති විට, ඉහත (ආ) ක්‍රමවේදය තෝරාගත හැකි ය. කෙසේ වුවද, කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය සතුව නිල නිවාස ඇති විටක දී ද, සුදුසුකම් ලත් නිලධරයා හට ඉහත (ඇ) ක්‍රමවේදය තෝරා ගැනීමේ නිදහස තිබේ. කොන්දේසි

7.3 (අ) කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සතු නිවාසයක් පරිහරණය කිරීමේ දී, එම නිවස පරිහරණය කරන නිලධාරියාගේ මාසික වැටුපෙන් 10% කට සමාන මුදලක් අයකර ගත යුතු වේ.

(ආ) කුලි නිවාසක් පරිහරණය කරන අවස්ථාවක දී , අදාල කුලියෙන් 10% කට සමාන මුදලක් එම නිලධාරියාගෙන් මාසිකව අයකර ගත යුතු වේ.

(ඇ) නිල නිවාස පහසුකම් හිමි නිලධාරයකු තම නිවස හෝ තමන් විසින් කුලියට ගත් නිවසක් පරිහරණය කරන විටක දී, එම නිලධරයාගේ මූලික වැටුපෙන් 10% කට සමාන මුදලක් ඔහුට මාසිකව ගෙවිය යුතු ය.

7.4 ඉහත සඳහන් සෑම අවස්ථාවකදී ම, නිවස පරිහරණය කරන්නා විසින්, එහි ජල ගාස්තු, විදුලි බිල්පත් ගාස්තු සහ ගෑස් සඳහා ගාස්තු දැරිය යුතු ය.

7.5 කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරය විමසීමෙන් අනතුරුව වරින් වර නිකුත් කරනු ලැබූ නියමයන්ට අනුව, සන්නිවේදන දීමනාවක් (Communication Allowances) ලැබීමට හිමි නිලධරයන් සඳහා ඔවුන් විසින් එකී සන්නිවේදන කටයුතු සඳහා වැයකළ වියදම් ඔවුන්ගේ වැටුප සමඟ ගෙවීම හෝ ප්‍රතිපූර්ණය කිරීම සිදු කළ යුතු ය.

7.6 කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා ඉහත (අ) යටතේ දක්වා ඇති ක්‍රමවේදයට අනුව නිල නිවාසයක් පරිහරණය කරන විට දී, අවස්ථාවෝචිත පරිදි එම නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනනය විසින් සැපයිය යුතු ය. එම නිවසෙහි භාණ්ඩ ලේඛනය, දේපල භාර නිලධරයා විසින් පත් කරනු ලැබූ නිලධරයකු විසින් පවත්වාගෙන යා යුතු අතර, එම භාණ්ඩ වාර්ෂික භාණ්ඩ සංගනනයට භාජනය කළ යුතු වේ.

7.7 කොමිෂන් සභාවේ සභාපතිවරයා / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා විසින් පරිහරණය කරනු ලබන නිවසට අදාල නිලධාරීන් විසින් ඉල්ලා සිටි විටක දී භාරකරුවකු පත් කිරීමට පියවර ගත යුතු වේ.

7.8 කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය සතු සියළුම නිවාස / පරිශ්‍රයන් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් යෙදිය යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා රැඳී සිටින නිවසට, එම නිවස කොමිෂන් සභාවට / විශ්වවිද්‍යාලයට අයිති නිවාසයන් වුවද, ආරක්ෂක නියාමකවරයකුගේ සේවය ලබාදිය යුතු වේ.

7.9 තම ධුරකාලය අවසානයේ දී, නිවාසයේ තමන් පරිහරණය කරන ලද භාණ්ඩ හොඳ තත්ත්වයෙන් යුතුව නැවත ආයතනයට භාරදීම, අදාල නිලධාරියාගේ වගකීමකි.

7.10 තමන් නිවස පරිහරණය කරන ලද කාලය තුල දී, එහි චංචල හෝ නිශ්චල දේපලකට වූ යම් හානියක් හෝ අස්ථානගත වීමක් සිදු වූ කල් හි, එකී හානිය හෝ අස්ථානගත වීමේ පිරිවැය නිවස පරිහරණය කළ නිලධාරයා විසින් දැරිය යුතු වේ.

7.11 ඉහත (අ) සහ (ආ) යටතේ නිවස පරිහරණය කරන අවස්ථාවන් හි දී, එම නිවසේ නඩත්තු කටයුතු අදාල ආයතනය විසින් සිදු කරනු ලැබේ.

7.12 නිල නිවසක් හිමි නිලධරයකු එම පහසුකම ලබා නො ගෙන සිටි විටක දී, ඔහුට ඉහත 7.3 (ඇ) හි සඳහන් දීමනාව හැර වෙනත් දීමනාවක් නො ගෙවනු ඇත.

8. **සංග්‍රහ දීමනා ප්‍රතිපූර්ණය කිරීම**

8.1 මෙහි VII වන පරිශිෂ්ඨයේ නම් සඳහන් කර ඇති තනතුරු දරන්නන්, කොමිෂන් සභාව විසින් නිගමනය කර ඇති ආකාරයට, සෑම මසක් අවසානයේ දී ම තම මූලික වැටුපෙන් යම් ප්‍රතිශතයක් සංග්‍රහ දීමනාව වශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට හිමිකම් ලබති.

සංග්‍රහ දීමනා ගෙවීම VII වන පරිශිෂ්ඨයේ සඳහන් පරිදි

8.2 සංග්‍රහ දීමනාව ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තන් තමන් විසින් කරන ලද සංග්‍රහ වියදම් සඳහා රිසිට් පත් / බිල්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර, ඒ වෙනුවෙන් ගෞරව ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සෑහේ.

ගෞරව ප්‍රකාශය

9. **පීඨයක පීඨාධිපතිවරයකු / අධ්‍යයනාංශ ප්‍රධානියකු සහ දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් ඇති වෙනත් තනතුරක් දරන තැනැත්තකු සඳහා දීමනා**

පීඨයක පීඨාධිපතිවරයකු සහ අධ්‍යයනාංශ ප්‍රධානියකු වෙත ගෙවීමට නියමිත විශේෂ දීමනාව, මහා භාණ්ඩාගාරය විමසීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබයි. යම් වෙනත් තනතුරක සේවය කිරීම වෙනුවෙන් විශේෂ දීමනාවක් හිමිවිය යුතු අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් එම ගෙවීම පිළිබඳව එම අවස්ථාවේ දී තීරණය කරනු ලැබේ.

පීඨයක පීඨාධිපති සහ අධ්‍යයනාංශ ප්‍රධානි

10. **නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම**

රජය කලින් කලට නියම කරනු ලබන උපරිම සීමාවන්ට යටත් ව සහ මෙහි VIII වන පරිශිෂ්ඨයට අනුව සන්නිවේදන පහසුකම් ලබා ගැනීම වෙනුවෙන්

සන්නිවේදන පහසුකම්

(කාර් යාලීය සහ නිවාස දුරකථන, ෆැක්ස්, පෞද්ගලික ජංගම දුරකථන සහ අන්තර් ජාල ) එසේ හිමිකම් ලත් නිලධාරීන් හට ගෙවීම් කළ හැකි ය. — VIII වන පරිශිෂ්ඨය අනුව

10.1 රාජකාරී කටයුතු සඳහා වෙන්කොට ලබා දී ඇති දුරකථනයක් වන්නේ, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක තම රාජකාරී නිලය අනුව ලබා දී ඇත්තේ ඍජු රැහන් දුරකථනයකි. යම් නිලධාරියකුගේ රාජකාරී ස්වභාවය අනුව, එකී පාලක බල මණ්ඩලයේ අනුමැතිය සහිතව රාජකාරී දුරකථනයක් ලබා දිය හැකි ය. — පවරා ඇති රාජකාරී දුරකථන පහසුකම් පිළිබඳ විග්‍රහය

10.2 ඉහත 10.1 උපඡේදයේ සඳහන් ආකාරයට වර්ග කොට නොමැති එහෙත් ඔහුගේ රාජකාරී ස්වභාවය අනුව දුරකථන පහසුකම් සැපයීම මැනැවැයි නිගමනය කරන ලද නිලධාරියකු හට, එම පාලක බල මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එසේ දුරකථන පහසුකම් ලබාදිය යුතු ය. — රාජකාරී ස්වභාවය පදනම් කොටගෙන විය යුතු වෙනත් තැනැත්තන්

10.3 දුරකථන බිලෙන් යම් මාසයක ඉතිරි වූ මුදලක් වේ නම්, එම මුදල එකී මුදල් වර්ෂය තුල ඉදිරි මාසයක් සඳහා රැගෙන යාමට හැකි ය. එහෙත් එවැනි ඉතිරි කිරීම් වෙනත් මුදල් වර්ෂයක් කරා රැගෙන යාමට අවසර නොමැත. — මුදල් වර්ෂය තුලදී වීම

10.4 තම පෞද්ගලික නිවස සඳහා දුරකථනයක් සවි කිරීමට අවශ්‍ය උපකරණ සහ උපාංග වෙනුවෙන් දරන ලද වැය බරක්, පෞද්ගලික ජංගම දුරකථනයක් හෝ අන්තර් ජාල පහසුකම් ලබා ගැනීම සඳහා කළ වියදමක් එම නිලධාරයා විසින් පෞද්ගලිකවම දරා ගත යුතුය. එම උපකරණ සඳහා කරන ලද වියදම් කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් ප්‍රතිපූර්ණය කිරීම ද නො කළ යුතු ය. — අවශ්‍ය උපකරණ අදාල තැනැත්තා විසින් ලබා ගත යුතු ය

10.5 මෙහි සඳහන් දුරකථන පහසුකම් ලැබීමට හිමිකම් ඇති යම් නිලධරයකු, මාසයකට වැඩි කාලයක් වැටුප් සහිතව හෝ රහිතව නිවාඩු ලබා ඇති විටක දී, ඔහුට එම කාලයට අදාල පෞද්ගලික (Residential) දුරකථන, ජංගම දුරකථන හෝ අන්තර් ජාල පහසුකම් වෙනුවෙන් කිසිඳු ගෙවීමක් නො කළ යුතු ය. කෙසේ වුවද, යම් නිලධරයකු විසින් වැටුප් සහිතව මාසයකට වැඩි කාලයක් නිවාඩු ලබා තිබුන ද, එම කාලය තුල දී තම රාජකාරී කටයුතු වලට සක්‍රීයව සම්බන්ධ වී ඇති විටක දී, එම කරුණු සළකා බලා ඔහුගේ නිවාස දුරකථන / පෞද්ගලික දුරකථන / අන්තර් ජාල පහසුකම් ගාස්තු ගෙවීමට අදාල පාලක බල මණ්ඩලයට තීරණය කළ හැකි වේ. — මාසයකට වැඩි කාලයක් නිවාඩු ගත් විට

11. **වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ඇති ආචාර්යවරුන් / නිලධාරීන් වෙත ගෙවිය හැකි දීමනා**

11.1 සම්පූර්ණ වැටුප් සහිතව අධ්‍යයන නිවාඩු ලබා ඇති යම් ආචාර්යවරයකු / නිලධාරියකු හට, ඔහුගේ වැටුප හා සම්බන්ධ සියළුම දීමනා ගෙවිය යුතු ය. — වැටුපට සම්බන්ධ දීමනා

## 12. පර්යේෂණ දීමනාව ගෙවීම

| | | |
|---|---|---|
| 12.1 | පනතෙහි ආචාර්යවරයකු ලෙස විග්‍රහ කොට ඇති තැනැත්තන් [එනම්; (පරිවාස) කථිකාචාර්යවරුන් , (සේවය ස්ථිර නොකරන ලද) කථිකාචාර්යවරුන්, II වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, I වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, සහය මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්] සහ පුස්තකාලයාධිපති, නියෝජ්‍ය පුස්තකාලයාධිපති, II සහ I ශ්‍රේණිවල ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, සහකාර පුස්තකාලයාධිපතිවරුන් හට මහා භාණ්ඩාගාරය විමසීමෙන් පසු කොමිෂන් සභාව විසින් නියම කොට ඇති පරිදි, තම මූලික වැටුපෙන් යම් ප්‍රතිශතයක් පර්යේෂණ දීමනාව වශයෙන් ලබා ගැනීමට සුදුස්සෝ වෙති. | ආචාර්යවරුන් හට |
| 12.2 | පර්යේෂණ දීමනාව ලැබීමට සුදුසුකම් ලද, ආචාර්යවරුන්, තමන් පර්යේෂණ දීමනාව ඉල්ලා සිටින වර්ෂයට අදාලව, දේශීයව / ජාත්‍යන්තර පරිසංවාදයක / සම්මේලනයක / විද්‍යාත්මක සැසියකට ඉදිරිපත් කළ ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණයක්, ගැන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. | හිමිකම ලැබීමට |
| 12.3 | පර්යේෂණ දීමනාව ඉල්ලා සිටින වර්ෂය තුල දී ආරම්භකොට දැනටමත් සක්‍රියව පවත්වාගෙන යනු ලබන පර්යේෂණ සඳහා ද, අදාල සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පර්යේෂණ දීමනාව ඉල්ලා සිටිය හැක. | යෙදී සිටින පර්යේෂණ |
| 12.4 | ඉහත 12.2 සහ 12.3 උපඡේදයන්ට අනුකූලව මෙතෙක් පර්යේෂණයක් ආරම්භකොට නොමැති තැනැත්තන්, තමන්ගේ පර්යේෂණ ස්වභාවය, පර්යේෂණයට ගතවන කාලය සහ පර්යේෂණ ක්‍රමවේදය සම්බන්ධයෙන්, සකස්කරන ලද පර්යේෂණ යෝජනාවක් අදාල පර්යේෂණ විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය. | පර්යේෂණයක් ආරම්භ කිරීම |
| 12.5 | මෙම ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත් ව ඒ ඒ තනතුරට අදාල වන පරිදි, ආචාර්යවරයකු නොවන පහත සඳහන් වැටුප් කේතයන් යටතේ වැටුප් ලබන තනතුරකට අයත් නිලධාරීන් ද පර්යේෂණ දීමනාව ලැබීමට හිමිකම් ලබති.<br><br>වැටුප් කේත U-AC 3, U-AC 4, U-AC 5, සහ U-MO වැටුප් කේතය යටතේ වැටුප් ලබන වෛද්‍ය නිලධාරීන් / දත්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සහ U-EX 2, U-EX 2(a) සහ U-EX 3 වැටුප් කේත යටතේ වැටුප් ලබන මධ්‍යම ශ්‍රේණිය සහ ඉන් ඉහළ ශ්‍රේණිවලට අයත් විධායක නිලධාරීන් | හිමිකම් ලබන අනෙකුත් තනතුරු |
| 12.6 | කතෘවරුන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණයන් සඳහා පර්යේෂණ දීමනාව ඉල්ලුම් කරන විට එකී අයදුම්පතට අදාල සේවකයා විසින් පර්යේෂණ කමිටුවේ ඇගයීම සහ අනුමැතිය පිණිස ඉදිරිපත් කළ යුතු ය. | කතෘවරුන් වැඩි සංඛ්‍යාවක් සිටින විට දී |
| 12.7 | කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පර්යේෂණ ඇගයීම් සහ ප්‍රගති සමාලෝචන කමිටුවක් කොමිෂන් සභාව විසින් ද, විශ්වවිද්‍යාලයක ආචාර්යවරුන් / නිලධාරීන් සඳහා එවැනි කමිටුවක් එහි සනාථන | පර්යේෂණ ඇගයීම් කමිටුව |

සභාව විසින් ද, විශ්වවිද්‍යාල විද්‍යායතනයක / ආයතනයක / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක ආචාර්යවරුන් / නිලධාරීන් සඳහා, අදාල පරිදි ශාස්ත්‍රීය කමිටුවක් විසින් ද, පර්යේෂණ ඇගයීම් සහ ප්‍රගති සමාලෝචන කිරීම පිණිස ස්ථාපිත කළ යුතු ය.

12.8 පර්යේෂණයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් අතුරු වාර්තාවක් පර්යේෂණය ආරම්භ කළ දිනයේ සිට සය මසක (06) කාලයක් තුල දී පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. පර්යේෂණ දීමනාව නො කඩවා ප්‍රදානය කිරීම පර්යේෂණය ලබා ඇති ප්‍රගතිය පිළිබඳ ව, පර්යේෂණ කමිටුව සෑහීමට පත්වීම මත රඳා පවතී. — ප්‍රගතිය ඇගයීම

ලබා ඇති ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමට පත් නොවන්නේ නම්, ලැබූ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා පර්යේෂණ කාලය උපරිමෙන් සය මසකින් (06) දීර්ඝ කිරීමට පර්යේෂණ කමිටුවට හැකියාව ඇති අතර, එම කාලය අවසානයේ දී, පර්යේෂණ දීමනාව නැවත ගෙවීම ආරම්භ කළ යුතු දිනය, ලබා ඇති ප්‍රගතියට අනුව කමිටුව විසින් නිගමනය කළ යුතු වේ. පර්යේෂණයේ ස්වභාවය සහ වපසරිය පාදක කර ගනිමින්, පර්යේෂණය සක්‍රියව පවත්වාගෙන යාම මත අවුරුදු තුනක (03) උපරිමයක් දක්වා පර්යේෂණ දීමනාව ගෙවිය හැකි ය.

12.9 වැටුප් සහිත අධ්‍යයන නිවාඩු මත හෝ සප්ත වාර්ෂික නිවාඩු මත විදේශ ගතව සිටින හෝ ආචාර්යවරයකු / නිලධරයකු හට, වරින් වර ප්‍රකාශයට පත් කරන්නා වූ කොන්දේසි සපුරාලීම මත, පර්යේෂණ දීමනාව ගෙවිය හැකි ය. — වැටුප් සහිත අධ්‍යයන නිවාඩු / සප්ත වාර්ෂික නිවාඩු මත

12.10 යම් ආචාර්යවරයකුගේ / නිලධරයකුගේ ඇපබැඳුම්කරයක සඳහන් මුදල් ප්‍රමාණයේ කොටසක් ලෙස පර්යේෂණ දීමනාව ද ඇතුලත් කළ යුතු ය. — ගිවිසුම් / ඇපකරයේ ඇතුලත් කළ යුතු ය

12.11 වැටුප් රහිත අධ්‍යයන නිවාඩු මත සිටින, වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු මත සිටින හෝ වෙනත් කුමන ආකාරයක වැටුප් රහිත නිවාඩු මත සිටින ආචාර්යවරයකු / නිලධරයකු හට පර්යේෂණ දීමනාව නො ගෙවිය යුතු ය. — වැටුප් රහිත අධ්‍යයන / සප්ත වාර්ෂික නිවාඩු

12.12 මෙම ඡේදයේ සඳහන් නියමයන්ට අනුව සිදු කරනු ලබන පර්යේෂණයන් යම් ආචාර්යවරයකුගේ/ නිලධරයකුගේ නිත්‍ය යම් රාජකාරීවලට බාධාවක් නොවන අයුරින් පවත්වා ගෙන යා යුතු වේ. — පර්යේෂණය නිත්‍ය රාජකාරී වලට බාධාවක් නොවිය යුතු ය

## 13. අධ්‍යයන දීමනාව / වෙනත් විශේෂ දීමනා

13.1 මහා භාණ්ඩාගාරය විමසීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් නිගමනය කර ඇති පරිදි, පනතෙහි "ආචාර්යවරයකු" ලෙස නිර්වචනය කර ඇති යම් තැනැත්තකු ඔහුගේ මූලික වැටුපෙන් යම් ප්‍රතිශතයක්, අධ්‍යයන දීමනාව ලෙස ලැබීමට හිමිකම් ලබයි. — අධ්‍යයන දීමනාව

13.2 රජය විසින් අනුමත කොට ඇති සීමාවන්ට යටත් ව, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන අයතනයන්හි / විද්‍යායතනයන්හි, සුදුසුකම් ලත් සේවකයෝ තම වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස විශේෂ දීමනාවක් ලැබීමට හිමිකම් ලබයි. — හිමිකම ඇති සේවකයින්ට ගෙවන විශේෂ දීමනාව

## 14. විදේශ ගමන් සහ අදාල වියදම් සඳහා වන දීමනා

14.1 විදේශ ගමන් සහ අදාල වියදම් සඳහා වන දීමනා ගෙවීම සළකා බැලීමට නම්, එම ගමන් සඳහා ප්‍රථමයෙන් රාජකාරී නිවාඩු සඳහා අනුමත කර තිබිය යුතු ය. — රාජකාරී / පුහුණුවීම් සඳහා විදේශ ගත වීමට දීමනා

14.2 ඉහත 14.3 සහ 14.4 උපඡේදයන් හි සඳහන් දීමනා ගෙවනු ලබන්නේ, එම දීමනාවක් සද්භාවයෙන් යුතුව වියදම් කරනු ඇතැයි යන අපේක්ෂාව මත ය.

එබැවින්, තමන්ට ලැබෙන දීමනාව උපයෝගී කර ගනිමින් කරන ලද වියදම් සඳහා මෙන් ම තමාට හිමිකමක් නො මැති යම් මුදලක් වේ නම් එය නැවත භාරදීමට ද එම වියදම් දරන්නා වගකිව යුතු වේ.

14.3 (අ) යම් තැනැත්තකු තම සුදුසුකම්, දැනුම සහ හැකියාවන් වර්ධනය කර ගැනීම උදෙසා අධ්‍යයන පුහුණුවීම්, සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සඳහා විදේශ ගත වන අවස්ථාවක දී, ඔහුගේ ප්‍රවාහන, දුරකථන සහ ගුවන්තොටුපළ බදු ආදිය ගෙවීම පිණිස, එම මුදල් රජය විසින් හෝ ආයතනය විසින් හෝ ප්‍රදානයක් විසින් හෝ නොගෙවන අවස්ථාවක දී, අනියම් දීමනා (Incidental Allowance) ගෙවිය හැකි ය. එසේ ගෙවනු ලබන දීමනා දින 30 ක කාලයකට සීමා විය යුතු අතර, එය මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රෙගුලාසි වලට අනුව රජය මඟින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකූල විය යුතු ය. — අනියම් දීමනා (Incidental Allowance)

(ආ) යම් තැනැත්තෙකු රජය නියෝජනය කරමින් විදේශ තනාපති කාර්යාලක සේවය සඳහා හෝ රාජකාරී කටයුත්තක් සඳහා විදේශ ගතවන විට හෝ තම විෂය පථයට අයත්, එහෙත් දිවයින තුළ දී ක්‍රියාත්මක කළ නො හැකි රාජකාරී කටයුත්තක් සඳහා හෝ විදේශගත වන විට, ඔහු විසින් විදේශයක දී දැරීමට සිදුවන ප්‍රවාහන, දුරකථන සහ ගුවන්තොටුපල බදු ගෙවීමට අවශ්‍ය දීමනාවක් ගෙවිය හැකි ය. කෙසේ වුවද, එවැනි දීමනාවක් ලැබීමට යම් තැනැත්තකු හිමිකම් ලබන්නේ ඔහුට විදේශ රජයකින් / ආයතනයකින්/ ප්‍රදානයක් මඟින් එම දීමනා ලබා නො දෙන්නේ නම් පමණකි. එවැනි අවස්ථාවක ගෙවන දීමනා දැනට බල පවත්නා මහා භාණ්ඩාගාර රෙගුලාසි වලට අනුව රජය විසින් වරින් වර නිගමනය කරනු ලබන පරිදි විය යුතු අතර, දින 15 ක උපරිම කාලයකට සීමා විය යුතු ය.

14.4 යම් තැනැත්තකු තම සුදුසුකම්, දැනුම සහ හැකියාවන් වර්ධනය කර ගැනීම උදෙසා, අධ්‍යයන, පුහුණුවීම්, සාකච්ඡා සහ සම්මන්ත්‍රණ හෝ ආයතනයේ විෂය පථයට අදාල එහෙත් දිවයින තුල දී ඉටුකළ — ඒකාබද්ධ දීමනාව

නොහැකි රාජකාරී කටයුත්තක් වෙනුවෙන් විදේශ ගතවන විට දී, ඔහුගේ ආහාර සහ ඉදුම් හිටුම් වෙනුවෙන් දැනට පවත්නා මහාභාණ්ඩාගාර රෙගුලාසි වලට අනුව රජය විසින් වරින් වර නියම කරනු ලැබු පරිදි ඒකාබද්ධ දීමනාවක් ගෙවිය හැකි ය. කෙසේ වුවද, එකී ඒකාබද්ධ දීමනාව ගෙවිය හැකි වන්නේ, විදේශ රජයකින්/ ආයතනයකින් / ප්‍රදානයක් මඟින් එම දීමනා නො ගවන්නේ නම් පමණි.

**35% ක ඒකාබද්ධ දීමනාව**

14.4.1 විදේශ රජයකින් / ආයතනයකින් / ප්‍රදානයකින් නවාතැන් පහසුකම් පමණක් සපයන අවස්ථාවක දී පවත්නා මහා භාණ්ඩාගාර රෙගුලාසි වලට අනුව ගෙවිය යුතු ඒකාබද්ධ දීමනාවෙන් 35% ක මුදලක් එම තැනැත්තාගේ ආහාර වියදම් සඳහා ගෙවිය යුතු ය.

**65% ක ඒකාබද්ධ දීමනාව**

14.4.2 විදේශ රජයකින් / ආයතනයකින් / ප්‍රදානයකින් ආහාර සඳහා පමණක් පහසුකම් සළසා ඇති අවස්ථාවක දී පවත්නා මහාභාණ්ඩාගාර රෙගුලාසි වලට අනුව ගෙවිය යුතු ඒකාබද්ධ දීමනාවෙන් 65% ක මුදලක් එම තැනැත්තාගේ නවාතැන් පහසුකම් සපයාගැනීම වෙනුවෙන් ගෙවිය යුතු ය.

**ගෙවීම් කළ යුතු සම්පූර්ණ දිනකට පමණි**

14.5 දීමනා ගණනය කරන විට දී, එසේ ගණනය කළ යුත්තේ දිවයිනෙන් පිටත්ව යන දිනයේ සිට නැවත දිවයිනට පැමිණෙන දිනය දක්වා ගැනෙන සම්පූර්ණ දින ගණනට අනුව ය. ඉතිරි වන කාලය පැය 12ක කාලයට නො අඩු වන්නේ නම්, එම කාලය ද සම්පූර්ණ දිනයක් ලෙස සැලකිය යුතු වේ.

**භාණ්ඩාගාර අනුමැතිය**

14.6 අධ්‍යයන නිවාඩු කාලය, පුහුණුවීම් කාලය, සාකච්ඡාවක් සඳහා විදේශයක ගත කරන කාලය, සම්මන්ත්‍රණ කාලය දින 30ක් ඉක්මවන විට දී ද, රාජකාරී සඳහා හෝ ආයතනයේ තම විෂය පථය තුලට ගැනෙන රාජකාරියක් සඳහා හෝ විදේශයක ගත කරන කාලය දින 15 ක් ඉක්මවන විටදී ද, දීමනා ගෙවීම සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වේ.

**ඒකාබද්ධ දීමනාව නොගෙවන අවස්ථා**

14.7 ජනාධිපති අරමුදල, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය (විශේෂ ශ්‍රේණිවල වෛද්‍යවරුන් පුහුණු කිරීම් සඳහා) සහ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව අරමුදල මඟින් ලබාදුන් ශිෂ්‍යත්වයන් මත විදේශගත වන යම් තැනැත්තෙකු හට ඒකාබද්ධ දීමනාව නො ගෙවිය යුතු ය.

කෙසේ වුවද, එකී ශිෂ්‍යත්ව සඳහා විදේශ රජයකින් / ආයතනයකින්/ ප්‍රදානයකින් Incidental Allowance නො ගෙවන අවස්ථාවක දී, ඔහුට මහා භාණ්ඩාගාරයේ අනුමත රෙගුලාසි වලට අනුකූලව පවත්නා Incidental Allowance දීමනාව උපරිම දින 15 ක කාලයක් සඳහා ගෙවිය හැකි ය. යම් තැනැත්තකු, විදේශ විශ්වවිද්‍යාලයක් / ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්වයක් / සහාකාරත්වයක් (Assistantship) මත අධ්‍යාපන කටයුතු හෝ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පූර්ණ කාලීනව විදේශ ගත වන විට ඔහුට කිසිදු දීමනාවක් නො ගෙවිය යුතු ය.

14.8 දිවයිනෙන් බැහැරවීමට ප්‍රථමයෙන් තමන්ට ලබා ගැනීමට තිබූ දීමනා ලබාගත නො හැකි වූ අවස්ථාවල දී, එම දීමනා නැවත දිවයිනට පැමිණීමෙන් පසුව ලබා ගත හැකිය.එසේ ලබා ගන්නා දීමනාව ගෙවිය යුත්තේ එම තැනැත්තා දිවයිනෙන් පිටත් වූ දිනයට අදාල ව පැවති විදේශ මුදල් හුවමාරු වටිනාකමට අනුව ය. — ලැබිය යුතුව තිබූ දීමනා පසුව ලබා ගැනීම

14.9 රාජකාරී විදේශ ගමනක යෙදෙන තැනැත්තෙකු, තමන් දිවයිනෙන් බැහැර වීමට ප්‍රථමයෙන් දිවයින තුල දී දරන ලද පහත සඳහන් වියදම් ඒම තැනැත්තා හට ප්‍රතිපූර්ණය කළ හැකි ය. — දිවයිනෙන් බැහැර වීමට ප්‍රථමයෙන් දරන ලද වියදම්

(අ) වීසා ගාස්තු : විදේශ රජයකින් / ආයතනයකින් / ප්‍රදායකයකුගෙන්/ ආයතනයක් මඟින් වීසා ගාස්තු නොගෙවන අවස්ථාවක දී පමණක් — වීසා ගාස්තු

(ආ) ගමන් බල පත්‍ර ගාස්තු : ගමන් බල පත්‍රයක් ලබා ගැනීම සඳහා එය අළුත් කිරීම ද ඇතුලත් ව දරන ලද වියදම් පමණි. එක් දින සේවාව උපයෝගී කරගනිමින් ගමන් බල පත්‍රයන් ලබා ගත් අවස්ථාක දී, එය සාමාන්‍ය සේවාව තුලින් ලබා ගැනීමට වැය කළ යුතු ගාස්තුවට සමාන මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කළ යුතු ය. — ගමන් බල පත්‍ර ගාස්තු

(ඇ) රක්ෂණ ගාස්තු : විදේශ රජයක් විසින් /ආයතනයක් විසින් /ප්‍රදානයක් මඟින්/ ආයතනයක් විසින් රක්ෂණ ගාස්තු නො ගෙවන අවස්ථාවක දී, මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශිත සීමාවන් ඉක්මවා නොයන පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයා / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියා යන අය මාර්ගයෙන් රක්ෂණ ගාස්තු ලබාගත හැකි ය. — රක්ෂණ ගාස්තු

14.10 දීමනා ලබාදීමේ දී තමන්ට හිමි නොමැති යම් මුදලක් ලැබී ඇත්නම්, එම මුදල තමන් දිවයිනට පැමිණි දින සිට මාසයක කාලයක් ඉක්ම යාමට පෙර, පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකමකට අනුව නැවත ගෙවිය යුතු වේ.

14.11 උණුසුම් ඇඳුම් / ඇඳුම් කට්ටල: — උණුසුම් ඇඳුම් / ඇඳුම් කට්ටල

යම් තැනැත්තකු, තම සුදුසුකම්, දැනුම හෝ පළපුරුද්ද වර්ධනය කිරීමට උපකාරි වන්නා වූ යම් පුහුණුවක් ඇතුලත් ශිෂ්‍යත්වයක්, අධ්‍යයන චාරිකාවක්, නිරික්ෂණ චාරිකාවක්, සංචාරක ප්‍රදානයක්, සම්මන්ත්‍රණයක් හෝ වෙනත් එවැනි ප්‍රදානයක් තුලින් රාජකාරියක් සඳහා ශිත දේශගුණය සහිත විදේශයකට යන අවස්ථාවක දී ඔහුට උණුසුම් ඇඳුම් දීමනාවක් හෝ ඇඳුම් කට්ටල දීමනාවක් වෙනත් ප්‍රභවයකින් නො ලැබෙන විට මහා භාණ්ඩාගාරය විමසීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් වරින් වර තීරණය කර ඇති පරිදි ගෙවිය හැකිය.

14.11.1 ශිත දේශගුනයක් සහිත රටවල් වන්නේ;

(අ) අක්ෂාංශ $35^0$ N ට උතුරින් පිහිටා ඇති උත්තරාධ ගෝලයේ සියළුම රටවල්

(ආ)අක්ශාංශ 30$^{0}$ S ට දකුණෙන් පිහිටි දක්ෂිනාර්ධ ගෝලයේ සියළුම රටවල්

(ඇ)මුහුදු මට්ටමේ සිට අඩි 5000 කට වඩා උසකින් පිහිටා ඇති සියළුම ප්‍රදේශ

14.11.2 අවුරුදු පහක (5) ක කාලයක් තුල දී, යම් තැනැත්තකු හට, එක් උණුසුම් ඇඳුම් / ඇඳුම් කට්ටල දීමනාවකට වඩා නොදිය යුතු ය.

14.11.3 උණුසුම් ඇඳුම් / ඇඳුම් කට්ටල දීමනාවක් ලබා ගත් තැනැත්තකු තමන් විදේශයක දී පාවිච්චි කිරීම පිණිස එම උණුසුම් ඇඳුම් ලබාගත් බවට වන සහතිකයක් එම ඇඳුම් ලබා ගත් විගසම ඉදිරිපත් කළ යුතු ය.

15. **වෛද්‍ය සුදුසුකම් සහිත ආචාර්යවරුන් / නිලධාරින් සහ දන්ත වෛද්‍ය සුදුසුකම් සහිත ආචාර්යවරුන් සඳහා ගෙවන දීමනාව**

15.1 වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයක නියමිත සුදුසුකම් ලද තැනැත්තකු උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය සඳහා පත් කළ අවස්ථාවක දී, ඔහු රජයේ සේවයේ සිටියා නම් ලද හැකිව තිබූ වැටුපට සමාන කිරීම සඳහා එම තැනැත්තා හට සමාන කිරීමේ දීමනාවක් (Equalization Allowances) ගෙවිය හැකි ය. සමාන කිරීමේ දීමනාව (Equalization Allowances)

15.2 කෙසේ වුවද, ඔහු විශ්වවිද්‍යාල සේවයේ දී ලබන සම්පූර්ණ පාරිශ්‍රමිකය, සෞඛ්‍ය ආමාත්‍යාංශය යටතේ සමාන ශ්‍රේණි නිලධරයකු හට ගෙවන පාරිශ්‍රමිකයට වඩා වැඩි වන්නේ නම්, එම තැනැත්තා ඉහත සඳහන් දීමනාවට හිමිකම් නො ලබයි.

15.3 මෙසේ ගෙවනු ලබන දීමනාව, එම තැනැත්තාගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල හෝ වෙනත් ගෙවීමක් සඳහා දායක වීමට ගණන් නො ගත යුතුවේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, සේවානියුක්තියන් ගේ භාර අරමුදලට දායක වීමක් නොමැත

16. **ශිෂ්‍ය උපදේශකවරුන්ට ගෙවන දීමනා**

16.1 සෑම උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් සඳහා ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයකු සහ එක් එක් පීඨයක සෑම සිසුන් දහසකටම (1000) එක් අයෙකු සිටින පරිදි, ශිෂ්‍ය උපදේශකවරයකු බැගින් එම පීඨයේ ආචාර්යවරුන් සහ / හෝ නිලධාරීන් අතුරින් පත්කල යුතු වේ. යම් ආයතනයක පවත්නා විශේෂිත තත්ත්වයක් යටතේ අමතර ශිෂ්‍ය උපදේශකයින් සංඛ්‍යාවක් තමන්ට සුදුසු යැයි හැඟෙන පරිදි පත්කිරීමට ඒ ඒ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා හට හැකියාව තිබේ. පත්කිරීම

16.2 එවැනි ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරුන්ට සහ ශිෂ්‍ය උපදේශකවරුන්ට කොමිෂන් සභාව විසින් නිගමනය කරන පරිදි මාසික දීමනාවක් ගෙවිය හැකි ය. දීමනා

17. **කොමිෂන් සභාවේ උප සභාපතිවරයාගේ, ලේකම්වරයාගේ / විශ්වවිද්‍යාලයක නියෝජ්‍ය උපකුලපතිවරයාගේ, ලේඛකාධිකාරීවරයාගේ / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාගේ, ලේකම්වරයාගේ / විද්‍යායතනයක අධ්‍යක්ෂකවරයාට / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික සහකාරවරයකු / වරියකු හට ගෙවන දීමනා** — පෞද්ගලික සහකාරවරුන්

17.1 ඉහත සඳහන් කොට ඇති පෞද්ගලික සහාකාරවරුන්ට

(අ)කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරන පරිදි පෞද්ගලික සහකාරවරයකු/ වරියක හට ඔහු / ඇය විසින් ඉටුකරනු ලබන රාජකාරී වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් ස්ථාවර මාසික දීමනාවක් ගෙවිය හැකි ය.

(ආ)මෙයට අමතරව ඔහු / ඇය විසින් සෙනසුරාදා, ඉරිදා, සහ වෙනත් නිවාඩු දිනයන්හි දී සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පිටත දී ඉටු කරනු ලබන සේවාවන් සඳහා සාමාන්‍ය පිළිවෙතට අනුව අතිකාල දීමනා ද ගෙවිය හැකි ය.

17.2 එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාට, ලේඛකාධිකාරීවරයාට හෝ ලේකම්වරයාට පෞද්ගලික සහකාරවරයකුගේ සේවය ලබා ගැනීම සුදුසු හෝ නුසුදුසු බව එම ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් තීරණය කළ යුතු වේ. එසේ පෞද්ගලික සහකාරවරයකු / වරියකගේ සේවට ලබා ගැනීම සුදුසු යැයි තීරණය කළ විට, ඔහුට / ඇයට මෙහි 17.1 උපඡේදයට අනුව ගෙවීම් කළ යුතු ය. — අධ්‍යක්ෂ / ලේඛකාධිකාරී / ලේකම්වරුන්ගේ පෞද්ගලික සහකාර

17.3 පෞද්ගලික සහකාරවරුන්ට / වරියන්ට ගෙවන දීමනා එක් එක් ආයතනයේ මුදල් ඇස්තමේන්තුවලට ඇතුලත් කළ යුතු වේ. — ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇති කළ යුතු ය

18. **උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය සඳහා ද්විතීයනය කරන ලද වෛද්‍ය නිලධාරීන් හට ගෙවනු ලබන අමතර රාජකාරී දීමනාව**

උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය සඳහා ද්විතීයනය කරන ලද වෛද්‍ය නිලධාරියකු හට සෞඛ්‍ය අමාත්‍යංශය මඟින් එවැනි නිලධාරීන් හට, ගෙවනු ලබන අමතර රාජකාරී දීමනාව ගෙවිය යුතු අතර, ඒ සඳහා වැය වන මුදල් අදාල ආයතනය සතු මුදල් සංචිත තුලින් සපයාගත යුතු වේ. — අමතර රාජකාරී දීමනාව

19. **නිවාඩු දිනයන්හි සේවය කරනු ලබන විධායක නිලධාරීන් සඳහා වන දීමනා (VIII වන පරිච්ඡේදයේ 18 වන ඡේදය බලන්න)** — නිවාඩු දිනවල දී සේවයට කැඳවන විධායක නිලධාරීන්ගේ දීමනා

19.1 සෙනසුරාදා, ඉරිදා සහ වෙනත් නිවාඩු දිනයක සේවය සඳහා කැඳවනු ලබන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා පහත සඳහන් අගයන්ට අනුව ගෙවීම් කළ යුතු ය.

(අ) පැය 08 ක අවම සේවා කාලයක් සඳහා නිලධාරයාගේ ඒකාබද්ධ ( මූලික ) මාසික වැටුපෙන් $^{1}/_{20}$ ක ප්‍රමාණයක්

(ආ)එවැනි විධායක නිලධාරීන්ගේ සේවය මාසයකට දින දෙකක් (02) පමණක් ලබා ගත යුතු අතර, එසේ සේවය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වන අතර, ගෙවීම් කිරීම ඒ අනුව කළ යුතුය.

(ඇ) එවැනි විධායක නිලධාරීන්ගේ සේවය මාසයකට දින දෙකකට (02) වඩා අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සේවය ලබා ගත හැකි අතර, ගෙවීම් කළ යුත්තේ ද ඒ අනුව ය.

**ගෙවීමට අදාල කොන්දේසි**

19.2 සෙනසුරාද, ඉරිදා හෝ වෙනත් නිවාඩු දිනයක සේවය කිරීම වෙනුවෙන් කිසිදු නිලධාරියකු හට පහත සඳහන් කොන්දේසි සපුරා නොමැති නම් ගෙවීම් නොකළ යුතු ය.

**පූර්ව අනුමැතිය**

(අ) එවැනි රාජකාරියක යෙදීම සඳහා අදාල නිලධරයා විසින් තම ඉහළ නිලධාරීන් මාර්ගයෙන් අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා තිබිය යුතු ය.

**අඛණ්ඩ පැමිනිම**

(ආ) ඔහු සේවයට වාර්තා කිරීමට නියමිත සති අන්තයට හෝ නිවාඩු දිනයට ප්‍රථමයෙන් යෙදෙන දින පහක (05) දී අඛණ්ඩ සේවයට වාර්තා කර තිබිය යුතු ය. මෙම අඛණ්ඩ දින ප්‍රමාණය ගණනය කිරීමේ දී අදාල සති අන්තයට හෝ නිවාඩු දිනයට ප්‍රථමයෙන් දින පහ (05) ඇතුලත දී යෙදෙන රාජකාරී නිවාඩු දිනයන්, රජයේ නිවාඩු දිනයන් යෙදී ඇත්නම් එය ද සේවය කළ දිනයක් ලෙස සලකනු ලැබේ.

(ඇ) යම් නිලධරයකු දින පහක් (05) අඛණ්ඩව සේවයට නොපැමිණි සති අන්තයේ හෝ නිවාඩු දිනයක සේවයට වාර්තා කළ විට, එසේ සේවය කිරීම වෙනුවෙන් ඔහුට හිලව් නිවාඩු ලබා ගත හැකි අතර, නිවාඩු දින සේවය කිරීමේ දීමනාව ලබා ගැනීමට හිමිකම් නො ලබයි. යම් නිලධරයකු එක් ලිත් මාසයක් තුල දී, නිවාඩු දින දෙකකට වඩා සේවය කිරීම වෙනුවෙන් අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට අපොහොසත් වු විට, එසේ සේවය කළ අමතර දින ගණන සඳහා හිලව් නිවාඩු ලබා ගැනීමට අවසරය තිබේ.

**අවසරදීම සිරිතක් ලෙස අපේක්ෂිත කරුණක් සේ නොවිය යුතු ය**

19.3 විධායක ශ්‍රේණියක නිලධාරීන් සඳහා සෙනසුරාදා, ඉරිදා සහ වෙනත් නිවාඩු දිනයක සේවය කිරීම සඳහා අවසර දීම එසේ සාමාන්‍යයෙන් සිරිතක් ලෙස කළ යුතු යැයි අපේක්ෂිත කරුණක් ලෙස නො සැලකිය යුතු ය. කුමන අවස්ථාවක දී වුවද, එම නිලධාරියා සෙනසුරාදා, ඉරිදා හෝ වෙනත් නිවාඩු දිනයක සේවයට වාර්තා කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණක් බවට අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයා / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා සෑහීමට පත්විය යුතු ය.

19.4 මෙම ඡේදය යටතේ සෙනසුරාදා, ඉරිදා සහ වෙනත් නිවාඩු දිනයක සේවය කිරීමෙන් පසුව ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් කිරීමට කුමන හෝ තත්ත්වයන් යටතේ වුව ද අනුමැතිය ලබා නොදිය යුතු ය. — ආවරණ අනුමැතිය පිළිගනු නොලැබේ

19.5 ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් සහතික කිරීමේ දී, ඉල්ලීම් කරනු ලබන නිලධරයා අදාල දිනයේ දී පැමිණීමේ ලේඛනයේ / ඉලෙක්ට්‍රොනික යන්ත්‍රයේ / වෙනත් ලේඛනයක නිසි පරිදි අත්සන් තබා ඇති බව සහ ඉල්ලීම් කරන පැය ගණන් නිසි ආකාරයෙන් ගණනය කොට ඇති බවට ද එසේ සහතික කරන නිලධරයා විසින් පෞද්ගලිකවම සෑහීමට පත්විය යුතු ය. — සහතික කරන නිලධාරියාගේ වගකීම

## 20. දිර්ඝ කාලීන සේවා දීමනාව

දිර්ඝ කාලීන සේවා දීමනාව

20.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක අවුරුදු 25,30,35 සහ 40 ක සතුටුදායක ප්‍රශංසනීය සේවයක් සපුරා ඇති සෑම සේවකයකු හටම, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන පරිදි, විශ්වවිද්‍යාල පද්ධතිය වෙත ඔවුන් විසින් ඉටුකරන ලද අඛණ්ඩ සේවය ඇගයීමට භාජනය කරනු ලැබේ.

යම් සේවකයකුගේ සේවා කාලයෙහි යම් අඛණ්ඩ ප්‍රශංසනීයභාවය අව්‍යාජ එකක් ද යන්න තහවුරු කර ගැනීමෙන් පසු අදාල දීමනා ගෙවීම, එක් එක් ආයතනයේ පාලක බල මණ්ඩලය සතු වගකීමක් වන්නේ ය.

20.2 කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබූ මුදල් ප්‍රමාණයන් ඉක්මවා නොයන පරිදි, එසේ ප්‍රදානය කරනු ලබන පදක්කමක /පලකයක ස්වාභාවය ද, එහි මෝස්තරය, ප්‍රමාණය සහ ආකෘතිය ද තම අභිමතය පරිදි තීරණය කිරීමට එක් එක් පාලක බල මණ්ඩලයන්ට හැකියාව තිබේ. — පදක්කම් /පලක

20.3 ප්‍රදානය කරනු ලබන ත්‍යාගයේ වටිනාකම කොමිෂන් සභාව විසින් කාලයට අනුරූපව තීරණය කරනු ඇත. අවුරුදු 25 ක ප්‍රශංසනීය සේවය වෙනුවෙන් ඇගයීමට භාජනය වූ සේවකයකු හට ඉන් අනතුරුව අවුරුදු.30, 35, 40 ආදී වශයෙන් දිර්ඝකාලීන සේවා ත්‍යාග ලබා ගත හැකි ය. කෙසේ වුවද, එවැනි අවස්ථාවක දී ඔවුන් හට හිමිවන්නේ ලැබීමට ඇති මුදලින් ඉතිරි ගෙවීම පමණකි. — ත්‍යාගයේ වටිනාකම

20.4 කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන ආයතනයන්හි / විද්‍යායතනයන්හි/ U-PL 1 සිට U-PL 3 දක්වා වැටුප් කේත යටතේ ශ්‍රේණි ගත කර ඇති ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ද කොමිෂන් සභාව විසින් වරින් වර තීරණය කරනු ලබන පරිදි, “දිර්ඝ කාලීන සේවා දීමනාවක් ” ගෙවිය හැකි ය. — ප්‍රාථමික කාර්ය මණ්ඩලය සඳහා දිර්ඝකාලීන සේවා දීමනාව ගෙවීම

එම දීමනාව ගෙවනු ලබන්නේ විශ්වවිද්‍යාල සේවයේ අවුරුදු 20 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද තැනැත්තන් හට පමණකි.

එම සේවකයින් වෙනත් වැටුප් කේතයන් සහිත ශ්‍රේණියකට යැවුනු පසු, එකී දිර්ඝ කාලීන සේවා දීමනාව ගෙවීම එතැන් පටන් අවසන් වනු ඇත.

20.4.1 මෙම කරුණ සඳහා අවශ්‍යා සේවා කාලය ගණනය කිරීමේ දී; — සේවා කාලය ගණනය කිරීම

(අ)යම් තැනැත්තකු විශ්වවිද්‍යාල සේවයේ තනතුරකට පත්වීමට ප්‍රථමයෙන්, රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක අඛණ්ඩ සේවා කාලයක්, එසේ සේවය කරන ලද කාලය, කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින් අනුමත කරන්නේ නම් ගණනය කළ හැකි ය.

(ආ)විනයානුකූල දඬුවමකින් අවසන් වූ යම් සේවය අත්හිටුවන ලද කාලයක්, ගණනය නොකළ යුතු ය.

(ඇ)වැටුප් වර්ධක උපයා ගැනීමට නොහැකි වූ කාලසීමාවන් ද මෙකී ගණනය කිරීම් වලට ඇතුලත් නොකළ යුතු ය.

(ඈ)වැටුප් රහිත හෝ අඩ වැටුප් මත සිටින ලද කාලසීමාවන් ද ගණනය කිරීමට ඇතුලත් නොවිය යුතු ය.

20.4.2 20.4 උපඡේදය යටතේ දිර්ඝකාලීන සේවා දීමනාව ලබන ප්‍රාථමික මට්ටමේ සේවකයකුගේ සේවය අසතුටුදායක වන්නේ නම්, එම දීමනාව ගෙවීම අත්හිටුවිය යුතු ය. — දීමනාව අත්හිටු වීම

20.4.3 දිර්ඝකාලීන සේවා දීමනාව ලබන, ප්‍රාථමික මට්ටමේ සේවකයකු වැඩ තහනමට ලක්වූ විට, එම සේවකයාගේ වැඩ තහනම් කොට ඇත්තේ අඩ වැටුප් මත නම්, ඔහුට දිර්ඝකාලින සේවාදීමනාවෙන් අඩක් ගෙවිය යුතු වේ. — වැඩ තහනම් කාලය තුල දීමනා

## 21. අර්ධ කාලීන කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරුවකු හට ගෙවන දීමනා

කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් යම් සේවකයකු හට, තම සාමාන්‍ය රාජකාරී වලට අමත රව අර්ධකාලීන කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරුවකු ලෙස සේවය කිරීමට කැඳවන ලද අවස්ථාවක දී, ඔහුට කොමිෂන් සභාව විසින් නිගමනය කරන ලද මාසික දීමනාවක් එම කාලය තුල දී ගෙවිය හැකි ය. — අර්ධ කාලීන කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු

## 22. පෝමලින් රසායනිකයට නිරාවරණය වීමේ අවදානම ඇති, වෛද්‍ය පීඨයක සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අනතුරු දීමනාවක් ගෙවීම

පෝමලින් රසායනිකයට නිරාවරණය වීමේ ඉහළ අවදානමක් ඇති වෛද්‍ය පීඨයක, කායව්‍යවච්ඡේද, ව්‍යාධිවේද සහ අධිකරණ වෛද්‍ය යන දෙපාර්තමේන්තුවල සේවය කරන කාර්මික නිලධාරීන්, රසායනගාර සහායකයින්, පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරුවන් සහ වැඩ සහයකයින් හට කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අනතුරු දීමනාව ගෙවිය යුත්තේ, අදාල අධ්‍යයනාංශ ප්‍රධානීන් විසින් දෙන ලද නිර්දේශයන්ට අනුකූලව ය. — අනතුරු දීමනාව

**23. පශ්චාත් මරණ පරීක්ෂණ සහයකයින්ට සහ පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරුවන් හට දීමනා**

පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු වල නියැලෙන පශ්චාත් මරණ පරීක්ෂණ සහායකයින්ට සහ කම්කරුවන් හට, කොමිෂන් සභාව විසින් වරින් වර තීරණය කරන පරිදි, ඔවුන්ගේ වැටුපට වැඩිමනක් වශයෙන් දීමනාවක් ගෙවිය යුතු ය. පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරුවන් හට දීමනා

**24. ජීවන වියදම් දීමනාව**

24.1 රජය විසින් වරින් වර නිගමනය කරනු ලබන පරිදි, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවකයින් සඳහා ජීවන වියදම් දීමනාවක් ගෙවිය යුතු ය. ජීවන වියදම් දීමනාව

24.2 දෛනික වැටුප් මත (අනියම් / දෛනික) සේවයට යොදවා ඇති තැනැත්තන් ද, රජය විසින් වරින් වර නිගමනය කරනු ලබන දෛනික ගාස්තු ප්‍රමාණයකට අනුව ජීවන වියදම් දීමනාව ලැබීම සඳහා හිමිකම් ලබති. අනියම් / දෛනික වැටුප් ලබන සේවකයන්

එයට වැඩිමනක් වශයෙන්, මෙහි ඉහත 13.2 උපඡේදයෙහි සඳහන් විශේෂ දීමනාවක් ද මසකට තිහෙන් එකක ($^1/_{30}$)ක අනුපාතිකයන් මත සහ එහි ඇති නියමයන්ට අනුව අදාල සේවකයින් හට ගෙවිය හැකි ය.

**25. ගෙවිය නොහැකි දීමනා**

25.1 පර්යේෂණ ප්‍රදානයන් මත සිදුකරනු ලබන පර්යේෂණ ව්‍යාපෘතියක යෙදී සිටින, ආචාර්යවරයකු හෝ වෙනත් නිලධාරියෙකු හෝ සම්බන්ධීකරණ කටයුතුවල යෙදී සිටින්නකු හට එම පර්යේෂණ ව්‍යාපෘතියට අදාල සේවාවන් සඳහා ආයතනයේ අරමුදල් උපයෝගී කර ගනිමින් කිසිදු දීමනාවක් නොගෙවිය යුතු ය. පර්යේෂණ ප්‍රදානයක් මත ඉටු කළ සේවන් වෙනුවෙන්

25.2 පර්යේෂණ ව්‍යාපෘතියක සේවා කටයුතුවල යෙදී සිටීම වෙනුවෙන් උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයකු සඳහා කිසිදු දීමනාවක් නොගෙවිය යුතු ය. පූර්ණ කාලීන ශිෂ්‍යයින්

**26. ලේඛනාගාරයන් භාරව සිටින පොත් බඳින්නන් සඳහා ගෙවිය හැකි දීමනා**

තම සාමාන්‍ය රාජකාරී කටයුතු වලට අමතරව, ලේඛනාගාරයක් භාරව සිටින පොත් බඳින්නන් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන ආකාරයට ඔවුන්ගේ වැටුපට අමතරව මාසික දීමනාවක් ගෙවිය හැකි ය. ලේඛනාගාරය භාරව සිටින පොත් බඳින්නන්

**27. ලඝු ලේඛකයින් සඳහා ගෙවන දීමනා**

කොමිෂන් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනයන්හි/ විද්‍යායතයන්හි පාලක බල මණ්ඩල, උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ/ කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුවල, කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ලඝු ලේඛකයින් සඳහා

පාලක බල මණ්ඩලය විසින් පත්කරනු ලබන යථායෝගී කමිටුවක හෝ අනු කමිටුවක රැස්වීම් වාර්තා, සටහන් කරනු ලබන ළඝු ලේඛකයින් සඳහා කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන ආකාරයට දීමනාවක් ගෙවිය හැකි ය.

## 28. පූර්ණකාලීන උපශාලධිපතිවරුන්ට දීමනා ගෙවීම

පූර්ණකාලීන උපශාලාධිපති තනතුරක් දරන්නෙකු හට, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන ආකාරයට ඔහුගේ මූලික වැටුපෙන් යම් ප්‍රතිශතයකට සමාන මුදලක් දීමනාවක් වශයෙන් සහ නිවාස පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් ඔහුගේ, මූලික වැටුපෙන් යම් ප්‍රතිශතයකට සමාන දීමනාවක් ද ලැබීමට ද හිමිකම් ලබති. උපශාලධිපතිවරුන්

නිවාස පහසුකම් ලැබුනු අවස්ථාවක දී, එහි පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව ක්‍රියාත්මක වීම නවතිනු ඇත. මෙම දීමනා, හුදෙක්ම ප්‍රවාහන දීමනා, යැපීම් දීමනා ආදී වූ දීමනා වශයෙන් සැලකෙන අතර, වැටුප් වැඩිවීමක් ලෙස නොගත යුතු ය.

## 29. තේරීම් කමිටු සාමාජිකයන් සඳහා ගෙවනු ලබන දීමනා

අනුමත බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් යම් පත් කිරීමක්, උසස් කිරීමක් උදෙසා පත් කරනු ලබන නිල බලයෙන් පත් වූ සාමාජිකයන් ද ඇතුළුව තේරීම් කමිටු සාමාජිකයන් සඳහා, ඔවුන් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පූර්ණකාලීන නිලධාරීන් වුව ද, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන ආකාරයට ගාස්තු ගෙවිය යුතු ය. දුරස්ථ සන්නිවේදන මාර්ගයන් උපයෝගී කර ගනිමින් එම කටයුතු වලට සහභාගී වන සාමාජිකයින් ද එකී ගෙවීම් සඳහා හිමිකම් ලබති. තේරීම් කමිටු සාමාජිකයන්

## 30. පරිපාලන නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ලබාගත් අධ්‍යාපනික / වෘත්තීමය සුදුසුකම් අගය කිරීම උදෙසා ගෙවනු ලබන වැටුප් වර්ධක දීමනා

30.1 පරිපාලන නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් මෙරට හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ උපාධියකට සමාන යැයි පිළිගත් ඩිප්ලෝමාවක් / වෘත්තීය සුදුසුකමක් ඇගයීම උදෙසා වැටුප් වර්ධක හතරක් (04) ලබා ගැනීමට හිමිකම් ඇත. උපාධියන් සඳහා / වෘත්තිය සුදුසුකම් සඳහා

30.2 පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රී ලංකා අධ්‍යපන සුදුසුකම් ව්‍යයුහයේ [ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශකය (SLQF)] තුන්වන (03) වන හෝ හතරවන (04) මට්ටමට සමාන වන ඩිප්ලෝමාවක් සහිත පරිපාලනමය නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු ඇගයීම් වස් ඔවුනට වැටුප් වර්ධක දෙකක් (02) ලබා ගැනීමට හිමිකම් ඇත. ඩිප්ලොමාවන් සඳහා වැටුප් වර්ධක දෙකක්

30.3 ඉහත සඳහන් වැටුප් වර්ධක ගෙවනු ලබන්නේ, දක්වා ඇති සුදුසුකම්, යම් තැනැත්තකු සේවයට බඳවා ගැනීම පිණිස අදාල බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් සුදුසුකමක් නොවූ විට පමණි. බඳවා ගැනීමේ පරිපාටියට අනුව අවශ්‍යා සුදුසුකමක් නොවිය යුතු ය

30.4 කෙසේ වුවද, යම් සේවකයකු ඉහත 30.1 සහ 30.2 උපඡේදයන්හි සඳහන් සුදුසුකම් වලින් එක් සුදුසුකමක් විෂයයෙහි පමණක් වැටුප් වර්ධක ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත. — එක් සුදුසුකමකට පමණි

## 31. ගමන් වියදම් දීමනා සහ සංයුක්ත දීමනා

31.1 තමාට පවරන ලද රාජකාරී කටයුත්තක යෙදීම සඳහා යම් ස්ථානයකට ගමන් කිරීමට අවශ්‍යවන තැනැත්තකු හට, රජය විසින් අනුමත කරන ලද රෙගුලාසි වලට අනුව ගමන් වියදම්, යැපීම් වියදම් සහ නවාතැන් වියදම් යන වියදම් ආවරණය වන පරිදි සංයුක්ත දීමනාවක් ගෙවිය යුතු ය. මෙම ගෙවීම ප්‍රතිපූර්ණය කිරීමක ආකාරයෙන් සිදුවිය යුතු අතර, එය අදාල තැනැත්තාගේ පෞද්ගලික පරිශ්‍රමිකයන් ලෙස නොසැලකිය යුතු වේ. — ගමන් වියදම් දීමනා

31.2 රාජකාරී ගමනක් ආරම්භ වන ස්ථානය වන්නේ අදාල තැනැත්තාගේ සේවා ස්ථානය හෝ ඔහුගේ නිවස යන දෙකින්, යාමට බලාපොරොත්තු වන ස්ථානයට ආසන්න ස්ථානය යි. — ගමන ආරම්භ වන ස්ථානය

31.3 (අ) රාජකාරී ගමනක යෙදෙන තැනැත්තා එම ගමන තමන්ට හැකි ඉක්මනින් එම ගමන නිමාකළ යුතු වේ. ඒ සඳහා යාමට ඇති කෙටිම මාර්ගය සහ අවම වියදම් ද භාවිතා කළ යුතු ය. — ගමනෙහි අරපිරිමැස්ම

(ආ) පිළිගත හැකි යම් හේතුවක් මත ගමන යාමේ දී සිදුවූ ප්‍රමාදයන් හෝ විකල්ප මාර්ග භාවිතා කිරීමට සිදුවූ අවස්ථාවක දී, ඒ බව අදාල ප්‍රවාහන ගාස්තු ඉල්ලුම් පත්‍රය හි සඳහන් කළ යුතු ය. එවැනි අවස්ථාවක දී, ප්‍රවාහන නිලධාරියා හෝ වෙනත් එවැනි වගකිව යුතු නිලධාරියකු හෝ අදාල පරිදි දැනුවත් කළ යුතු වේ. — ප්‍රමාද වීම්/ මාර්ගයේ වෙනස් වීම් වාර්තා කළ යුතු ය

(ඇ) යම් තැනැත්තකු සාමාන්‍යයෙන් යාමට තිබූ මාර්ගයක් තිබිය දී, වෙනත් දීර්ඝ මාර්ගයක් භාවිතා කරමින් ඒ සඳහා වැඩිපුර වියදමක් දරා ඇත්නම්, ඔහුට ගෙවිය යුත්තේ, වඩාත් ලාභදායී මාර්ගයකින් එම ගමනෙහි යෙදුනා නම් ගෙවිය යුතුව තිබූ මුදල් ප්‍රමාණයයි. — වඩාත් ලාභදායී මාර්ගයට ගෙවීම පමණි

31.4 රාජකාරී කටයුත්තක් වෙනුවෙන් ගමනෙහි යෙදෙන තැනැත්තකු ඔහු විසින් සම්පූර්ණ කරන ලද සෑම විසි හතර (24) පැයක කාලයක් සහ රාජකාරී කිරීමට නියමිත ස්ථානයෙන් බැහැර වූ යම් කාලයක් ඇත්නම්,අනුපාතිකව ගණන් බලන ලද සමාන කාලයක් වශයෙන් ද, ගමන් කරන ලද දුර ප්‍රමාණය කිලෝ මීටර එකොළහක් (11 km) ඉක්මවා ඇති විටක දී, ඔහුගේ නවාතැන් සහ යැපීම වෙනුවෙන් පහත සඳහන් පරිදි සංයුක්ත දීමනා ගෙවිය යුතු ය. — සංයුක්ත දීමනා

(අ) පැය 12 කට නොඅඩු කාලයක් සඳහා සම්පූර්ණ සංයුක්ත දීමනාව

(ආ) පැය 6 කට නොඅඩු කාලයක් සඳහා සම්පූර්ණ සංයුක්ත දීමනාවෙන් අඩක්

(ඇ) පැය 6 කට අඩු කාලයක් සඳහා සංයුක්ත දීමනා හිමි නොවේ

(ඈ) බැහැරව සිටින කාලය පැය 24 කට වඩා වැඩිවන අවස්ථාවක

දී, එසේ ගතවන සෑම පැය 24ක කාලයකටම අමතරව 25% සංයුක්ත දීමනාවක් ගෙවිය යුතු අතර, එය සති තුනක කාලයක් සඳහා පමණක් ගෙවිය යුතු වේ. මෙම 25% අමතර දීමනාව පැය 24 කට වඩා අඩු කාලසීමාවක් සඳහා නොවිය යුතු ය.

(ඉ) ඉහත (ඇ) හි සඳහන් 25% දීමනාව ලබා ගැනීමට රියදුරන් සහ රිය සහකයින් හිමිකම් නොලබයි.

## 32. කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතන / විද්‍යායතන විසින් පවත්වනු ලබන විභාගයන්ට අදාල, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම සහ ඇගයීම, සුපරීක්ෂණය සහ අධීක්ෂණය සඳහා ගෙවිය හැකි ගාස්තු

උපාධි (අභ්‍යන්තර /බාහිර ) සහ පශ්චාත් උපාධි විභාගයන් පැවැත්වීම සහ ඒ හා සම්බන්ධ කටයුතු, බඳවා ගැනීම් / උසස් කිරීම් සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණ, යෝග්‍යතා පරීක්ෂණ ආදිය සඳහා ගෙවන ගාස්තු කොමිෂන් සභාව විසින් IX වන පරිශිෂ්ඨයේ සඳහන් පරිදි වරින් වර නිගමනය කළ යුතු වේ. — විභාග පැවැත්වීම IX වන පරිශිෂ්ඨය

## 33. බාහිර කථිකාචාර්යවරුන්ගේ ප්‍රවාහන සහ අනෙකුත් දීමනා

33.1 පූර්ව විශ්වවිද්‍යාල මට්ටමේ පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්යවරුන් හට ගෙවනු ලබන දීමනා, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ඇත. විශේෂිත විෂය ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය වන විදේශික විශේෂඥයින්ගේ සේවය, උසස් අධ්‍යාපන ආයතන / විද්‍යායතන මඟින්, වීඩියෝ තාක්ෂණය ආදි සුදුසු මාධ්‍යයන් භාවිතා කරමින් ලබාගත හැකි අතර, එකී විදේශ විශේෂඥයින්ද කොමිෂන් සභාව විසින් නිගමනය කරන පරිදි ගෙවීමක් ලැබීම සඳහා හිමිකම් ලබති. — බාහිර කාර්ය මණ්ඩලයට ගෙවන ගාස්තු ප්‍රමාණයන් IV වන පරිශිෂ්ඨය

33.2 බාහිර කථිකාචාර්යවරුන්ට ගෙවනු ලබන දීමනාව ද, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන පරිදි ගෙවිය යුතුය. — ගමන් වියදම් දීමනාව

33.3 බාහිර කථිකාචාර්යවරයකු, කිලෝ මීටර හතළිහක් (40 km) ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගමනෙහි යෙදෙන විට, එම එක් එක් අවස්ථාවක දී ඔහු අවම වශයෙන් පැය දෙකක (02) කාලයක් හෝ සේවය කිරීම අවශ්‍ය වේ. — අවම වශයෙන් පැය 02 ක්

33.4 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ආචාර්යවරයකු, නිලධාරියකු හෝ වෙනත් සේවකයකු වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක / පීඨයක බාහිර කාර්ය මණ්ඩල සාමාජිකයකු වශයෙන් තම සේවය ලබාදෙන අවස්ථාවේදී ද, ඉහතින් සඳහන් කොට ඇති ගාස්තු ප්‍රමාණයම ඔවුනට ද අදාල කර ගත හැකි ය. — අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන / පීඨ වෙතින් පැමිණෙන බාහිර කාර්ය මණ්ඩලය

33.5 පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගන්නා අවස්ථාවන්හි දී, ඔවුනට ගෙවිය යුතු උපරිම ගාස්තු ප්‍රමාණය, එකී උසස් අධ්‍යාපන ආයතනයන් හි / විද්‍යායතනයන් හි පාලක බල මණ්ඩලය විසින්, කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලැබූ අවම ගාස්තු ප්‍රමාණය පාදක කර ගනිමින් තීරණය කළ හැකි ය. එවැනි අවස්ථාවක දී එසේ තීරණය කරනු ලැබූ ගාස්තු ප්‍රමාණය කොමිෂන් සභාවට දැනුම් දිය — පශ්චාත් උපාධි පාඨමාලා

යුතු ය. එසේ ගාස්තු ගෙවීම, අදාල පශ්චාත් උපාධි පාඨමාලාවේ අරමුදල් තුලින් කළ යුතු අතර, පාඨමාලාව සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ දී එවැනි ගාස්තු ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුලත් කිරීමට ද වගබලා ගත යුතු වේ.

**34. ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීම් සහ විභාග වැරදි වලට අදාල සිද්ධීන් සඳහා පරීක්ෂණ පැවැත්වීමට පත්කරන පරීක්ෂණ කමිටු සාමාජිකයන් සඳහා ගෙවීම් කිරීම**

ශිෂ්‍යයින්ගේ විනය විරෝධී කටයුතු හෝ විභාග වැරදි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය මඟින් පත්කල සාමාජිකයන් තිදෙනෙක් නො ඉක්මවන පරීක්ෂණ කමිටුවක සාමාජිකයන් හට කොමිෂන් සභාව මඟින් නිගමනය කරන ලද ගාස්තු ප්‍රමාණයක් ගෙවිය හැකි ය. විනය විරෝධී කටයුතු ගැන පරීක්ෂණ පැවැත්වීම

**35. ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීම් හා සම්බන්ධ සිද්ධීන් පරීක්ෂා කිරීම පිණිස පවත්වනු ලබන පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම**

කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ශිෂ්‍යයන්ගේ විනය විරෝධි හැසිරීම්වලට අදාල සිද්ධින් පරීක්ෂා කිරීම සඳහා පත් කරනු ලබන පරීක්ෂණ නිලධාරීන් / පැමිණිල්ල මෙහෙය වන නිලධාරීන් සහ යතුරු ලියන කරන්නන් හෝ ලඝු ලේඛකයන් සඳහා ගෙවීම් කිරීම, රජය විසින් නිගමනය කොට ඇති පරිදි කොමිෂන් සභාව විසින් වරින් වර ඇති කරන ලද්දා වූ ප්‍රතිපාදන වලට අනුකූලව සිදුකළ යුතු ය. ශිෂ්‍ය විනය විරෝධි සිද්ධින් සඳහා පවත්වන පරීක්ෂණ

**36. හිමිකම් ලත් නිලධාරීන් සඳහා ලබාදෙන ඉන්ධන / ප්‍රවාහන දීමනාව**

36.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ඉන්ධන සහ / හෝ ප්‍රවාහන දීමනාව ලැබීමට හිමිකම් ඇති නිලධාරියකු හට XXIV පරිච්ඡේදයේ 1.3 උපඡේදයෙහි දක්වා ඇති ආකාරයට එම දීමනාවන් ගෙවිය යුතු ය. ඉන්ධන සහ / හෝ ප්‍රවාහන දීමනාව

36.2 එසේ ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව හෝ ඉන්ධන දීමනාව එම නිලධාරියාගේ මාසික වැටුපට එකතු වනු ඇත. මාසික වැටුපට එකතු කළ යුතු ය